# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2104/16 - 2018 දෙසැම්බර් මස 31 වැනි සඳුදා - 2018.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2018 අංක 35 දරන මුදල් පනත

නිවේදනය

2018 අංක 35 දරන මුදල් පනතේ 51 වැනි වගන්තිය සමග කියවිය යුතු 48 වගන්තිය මගින් මා වෙත පවරනු ලැබූ බලතල අනුව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මම, මෙම නියමය මගින් පහත සඳහන් නියෝග ප්‍රකාශයට පත් කරමි.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2018 දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

නියෝග

1. 2019 අංක 1 දරන මුදල් පනතේ රෙගුලාසි (ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවා අය බද්ද) ලෙස සඳහන් කර ඇති මෙම රෙගුලාසි 2019 ජනවාරි මස 01 වන දින සිට බලපැවැත්වේ.

2. ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවා මත අය බද්ද (මින් පසු ''බද්ද'' වශයෙන් හඳුන්වනු ලබන) කෙටි පණිවුඩ සේවා හරහා විශාල සංඛ්‍යාවකින් යවනු ලබන ප්‍රචාරක දැන්වීම් මත, එක් එක් ජංගම දුරකථන කෙටි පණිවුඩයක් සඳහා ශත 25 ක අය බද්දක් අයකරනු ලැබිය යුතු ය.

3. ජංගම කෙටි පණිවුඩ සේවාව සපයන ජංගම දුරකථන සේවා සපයන්නන් සඳහා අයකරනු ලබන ගාස්තු, අදාළ ජංගම කෙටි පණිවුඩ සේවාව සපයන ක්‍රියාකරු විසින් ගෙවනු ලැබිය යුතු ය.

4. 2019 ජනවාරි මස 01 වන දින සිට ජංගම දුරකථන ක්‍රියාකරුවන් විසින් සෑම මසකම එකතු කරන ලද බද්ද, ඊළඟ මාසයේ 15 වන දින හෝ ඊට පෙර විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත (මින් පසු ''කොමිෂන් සභාව'' ලෙස නම් කර ඇති) බැර කළ යුතු අතර කොමිෂන් සභාව විසින් එම මුදල ලැබී දින 15 ක් ඇතුළත, එම මුදල ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතු ය.

5. දැන්වීම්කරු විසින් ජංගම දුරකථන ක්‍රියාකරුවන් වෙත ගෙවනු ලබන බද්ද, එම දුරකථන ක්‍රියාකරුවන්ගේ ආදායමේ කොටසක් නොවිය යුතු ය.

1A - PG 4343 — 592 (2019/01)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

6. දැන්වීම්කරුවන්ගේ නිෂ්පාදන හෝ සේවා ප්‍රවර්ධනය කිරීමේ අදහසින් නොවන පාරිභෝගිකයාට විශේෂිතවූ නිවේදන, දැනුම්දීම්, සුභපැතුම් හෝ අමාත්‍යවරයා විසින් වරින්වර අනුමත කරනු ලබන සමාන ආකාරයේ පණිවිඩ සඳහා බද්ද අය නොකෙරේ.

මෙම නියෝග වල කාර්යය සඳහා

i. ''විශාල සංඛ්‍යාවකින් යවනු ලබන වෙළඳ දැන්වීම්'' යන්නෙන් වාණිජ පරමාර්ථ සඳහා ලැබුම්කරුවන් සමූහයක් වෙත ජංගම දුරකථන හරහා යවනු ලබන පණිවුඩ අදහස් වේ.

ii. ''ජංගම දුරකථන කෙටි පණිවිඩ'' යන්නෙන් ජංගම දුරකථන හරහා යවනු ලබන වචන ඇතුළත් කෙටි පණිවිඩයක් අදහස් වේ.

iii. ''ජංගම දුරකථන ක්‍රියාකරු'' යන්නෙන් 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ බලපත්‍රලත් ක්‍රියාකරුවකු අදහස් වේ.

iv. ''විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව'' යන්නෙන් 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අදහස් වේ.

01 - 409

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.